*[සියලුම හිමිකම් ඇවිරිණි]*
*[முழுப் பதிப்புரிமையுடையது]*

*மாகாணக் கல்விக் காரியாலயம் - வட மாகாணம் - இரண்டாம் மொழி சிங்களம்,*

**පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**උතුරු පළාත**
**දෙවන ජාතික භාෂාව - සිංහල - 2025**
**மாகாண கல்வித் திணைக்களம்**
**வட மாகாணம்**
**இரண்டாம் மொழி (சிங்களம்)- 2025**
**தரம் 11**

| 65 | S | I/II |
|---|---|---|

**දෙවන බස - සිංහල I, II**
**இரண்டாம் மொழி - சிங்களம் I, II**
**Second Language – Sinhala I, II**

***පැය තුනයි***
***மூன்று மணித்தியாலம்***
***Three hours***

***අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි***
***மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்***
***Additional Reading Time – 10 minutes***

**I – පත්‍රය**

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**
  **எல்லா வினாக்களுக்கும் விடை தருக.**

**1.** අංක 01සිට 40 තෙක් ප්‍රශ්නවලට, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
**01 முதல் 40 வரையுள்ள வினாக்களுக்கு தரப்பட்ட (1), (2), (3), (4) விடைகளில் சரியான அல்லது மிகப் பொருத்தமான விடையைத் தெரிவு செய்க.**

**2.** 01 සිට 05 තෙක් ප්‍රශ්නවල තද කළු අකුරින් මුද්‍රිත පදය වෙනුවට යෙදිය හැකි වඩාත් ම සුදුසු පද යුගළය තෝරන්න.
**01 முதல் 05 வரையுள்ள வினாக்களில் தடித்த எழுத்தில் தரப்பட்ட சொல்லுக்கு பதிலாக இடத்தக்க மிகப் பொருத்தமான சொற்சோடியை தெரிவு செய்க.**

01. **මාත්තෙක්ක** සෙල්ලම් කරන්න.
1. මාත් තෙක්ක 2. මමත් තෙක්ක 3. මාත් එක්ක 4. මා තෙක්ක

02. දූන් පූජාව **ඉවරැති**.
1. ඉවර ඇති 2. ඉවර රැති 3. ඉව රැති 4. ඉවර එති

03. මම හෙට කොළඹට **යන්නෝනෑ**.
1. යන්නෝ නෑ 2. යන් නෝනෑ 3. යන්න නෝනෑ 4. යන්න ඕනෑ

04. බැංකුවෙන් **සල්ලිත්තරන්** එන්න.
1. සල්ලිත තරන් 2. සල්ලිත් අරන් 3. සල්ලි අරන් 4. සල්ලි තරන්

05. දවල් කෑම **කන්නැත්තෙ** ඇයි ?
1. කන් නැත්තෙ 2. කන්න නැත්තෙ 3. කන්නෙ නැත්තෙ 4. කන්න ඇත්තෙ

**3. 06 සිට 10 තෙක් ප්‍රශ්නවල නිවැරදි උච්චාරණය සහිත පදය තෝරන්න.**
**06 முதல் 10 வரையுள்ள வினாக்களில் சரியான உச்சரிப்பை தரும் சொல்லை தெரிவு செய்க.**

| | | | | |
|---|---|---|---|---|
| 06. | 1. දන්ත සායනය | 2. දන්ද සායනය | 3. දත්ත සායනය | 4. දන්න සායනය |
| 07. | 1. නාට්ටිය | 2. නාට්‍යය | 3. නාට්ටය | 4. නාට්යය |
| 08. | 1. නකර ශාලාව | 2. නගර ශාලාව | 3. නගර ෂාලාව | 4. නහර ශාලාව |
| 09. | 1. ක්‍රීඩා සමාජය | 2. ක්‍රීටා සමාජය | 3. කිරීඩා සමාජය | 4. ක්‍රීඩා සමාසය |
| 10. | 1. දෙපාර්දමේන්තුව | 2. ඩිපාටමේන්තුව | 3. දෙපාර්මේන්තුව | 4. දෙපාර්තමේන්තුව |

**4. 11 සිට 14 තෙක් ප්‍රශ්නවල, දී ඇති වාක්‍යයට වඩාත් ගැළපෙන ප්‍රශ්න වාක්‍යය තෝරන්න.**
**11 முதல் 14 வரையுள்ள வினாக்களில் தரப்பட்டுள்ள வாக்கியத்திற்கு மிகப் பொருத்தமான வினா வாக்கியத்தை தெரிவு செய்க.**

11. කමල් බත් කන්න කැමතියි.
    1. කමල්ට කන්න කැමති මොනව ද?
    2. කමල් කන්න කැමති මොනව ද?
    3. කමල්ට කන්නේ කැමති මොනව ද?
    4. කමල් කනවා කැමති මොනව ද?

12. බැංකුව තියන්නේ අතන.
    1. බැංකුව කියන්නේ කොහේ ද?
    2. බැංකුවක් තියනවා කොහ ද?
    3. බැංකුව තියන්නේ කොහේ ද?
    4. බැංකුව තියනවා කොහේ ද?

13. මම හෙට කොළඹ යනවා.
    1. ඔයා හෙට යන්නේ කීයට ද ?
    2. ඔයා හෙට යන්නේ කොහේ ද ?
    3. ඔයා හෙට යනවා ද ?
    4. ඔයා හෙට යන්නේ මොක ද ?

14. රාජු දුවගෙන එනවා.
    1. දුවගෙන එනවා කවරෙක් ද?
    2. දුවගෙන එන්නේ කවරෙක් ද ?
    3. දුවන්න එන්නේ කවරෙක් ද ?
    4. දුවන්න එන්නේ කවරෙක් ද ?

**5. 15 සිට 17 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.**
**15 முதல் 17 வரையுள்ள வினாக்களில் சரியான எழுத்துக்கூட்டலை கொண்ட சொல்லை தெரிவு செய்க.**

| | | | | |
|---|---|---|---|---|
| 15. | 1. කාන්දාරය | 2. කාන්තාරය | 3. ගාන්දාරය | 4. ගාන්තාරය |
| 16. | 1. ශබ්ද විකාශනය | 2. සබ්ද විකාසනය | 3. ශබ්ධ විකාසනය | 4. ශබ්ද විකාෂනය |
| 17. | 1. ප්‍රතමාදාර | 2. ප්‍රථමාදාර | 3. ප්‍රතමාධාර | 4. ප්‍රථමාධාර |

**6.** 18 සිට 20 තෙක් ප්‍රශ්නවල නොගැළපෙන පදය තෝරන්න.
**18 முதல் 20 வரையுள்ள வினாக்களில் பொருத்தமற்ற சொல்லை தெரிவு செய்க.**

18. 1. වැස්ස    2. මැස්ස    3. ගංවතුර    4. ජලය

19. 1. මාතා    2. මැණිය    3. පීතෘ    4. මව

20. 1. අව්ව    2. වැස්ස    3. සීතල    4. සුළඟ

**7.** 21 සිට 23 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට සමාන පදය තෝරන්න.
**21 முதல் 23 வரையுள்ள வினாக்களில் தரபட்டடுள்ள சொல்லுக்கு பொருத்தமான ஒத்த சொல்லை தெரிவு செய்க.**

21. මාර්ගය
1. මාරුව    2. පාර    3. අවසානය    4. වර්ගය

22. ප්‍රවේශය
1. පිටවීම    2. පිවිසීම    3. ආරාධනය    4. ආවේශය


23. උපකාරය
1. විපත්තිය    2. උදව්ව    3. උපදේශය    4. ඔවදන්

**8.** 24 සහ 25 ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
**24 மற்றும் 25 வினாக்களில் தரபட்டடுள்ள சொல்லுக்கு பொருத்தமான எதிர்க் கருத்துள்ள சொல்லை தெரிவு செய்க.**

24. ආරම්භය
1. අවාසනාව    2. අවසානය    3. අවශ්‍ය    4. පටන් ගැන්ම

25. පෙර
1. පරක්කු    2. අවේලාව    3. පසු    4. ප්‍රමාද


**9.** 26 සිට 28 තෙක් ප්‍රශ්නවල මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් දෙන පදය තෝරන්න.
**26 முதல் 28 வரையுள்ள வினாக்களில் தரபட்டடுள்ள படத்திற்கு பொருத்தமான கருத்தை தரும் வடையை தெரிவு செய்க.**

26.


1. කුරුලු අභය භූමිය
2. ඉන්ධන පිරවුම් හල
3. තැපැල් කාර්යාලය
4. සත්වෝද්‍යානය

27.


1. දුම් බීම තහනම්.
2. දුම් බොන ස්ථානය
3. වහා ගිනි ඇවිලෙන සුළු ය
4. දුම් වැටි විකිණීම තහනම්.

28.


1. රෝගීන්ට පමණි
2. හදිසි ප්‍රතිකාර පමණි
3. රෝහල ඉදිරියෙනි
4. බෙහෙත් අලෙවි සැල

**10.** **29 සහ 30 ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍යයට ගැළපෙන පිළිතුර තෝරන්න.**
**29 மற்றும் 30 வினாக்களில் தரபட்டடுள்ள வாக்கியத்திற்கு பொருத்தமான பதிலை தெரிவு செய்க.**

29. අද සෙනසුරාදා නම්, අනිද්දා කවර දා ද?

1. ඉරිදා 2. සඳුදා 3. අඟහරුවාදා 4. සිකුරාදා

30. ජීවත් වීම සඳහා කරන රැකියාව,

1. ජීවනාලිය 2. ජීවිතාරක්ෂාව 3. ජීවනෝපාය 4. ජීවිත දර්ශනය

**11.** **31 සහ 32 ප්‍රශ්නවල මුලින් දී ඇති වාක්‍ය දෙක නිවැරදි ව සම්බන්ධ කර ලියා ඇති තනි වාක්‍යය තෝරන්න.**
**31 மற்றும் 32 வினாக்களில் முதலில் தரபட்டடுள்ள வாக்கியங்களை சரியாக இணைந்து ஒரு வாக்கியமாகி எழுதப்பட்ட விடையை தெரிவு செய்க.**

31. අම්මා මල් නෙලුවා ය. අම්මා පන්සලට ගියා ය.

1. අම්මා මල් නෙලන්නට පන්සලට ගියා ය.
2. අම්මා පන්සලට ගොස් අම්මා මල් නෙලුවා ය.
3. අම්මා මල් නෙලා පන්සලට ගියා ය.
4. අම්මා මල් නෙලමින් අම්මා පන්සලට ගියා ය.

32. මම මුහුණ සෝදමි. මම හිස පීරමි.

1. මම මුහුණ සෝදා හිස පීරමි.
2. මම මුහුණ සෝදන්නට හිස පීරමි.
3. මම මුහුණ සෝදමින් හිස පීරමි.
4. මම හිස පීරමින් මුහුණ සෝදමි.

**12.** **33 සහ 34 ප්‍රශ්නවල හිස්තැනට වඩාත් සුදුසු පිළිතුර තෝරන්න.**
**33 மற்றும் 34 வினாக்களில் இடைவெளிக்கு மிகப் பொருத்தமான விடையை தெரிவு செய்க.**

33. කමලා ………………… සහභාගි වුණා.

1. තරගයක් 2. තරගයට 3. තරගයෙන් 4. තරගය

34. ඔහු ………………… දිව්වා.

1. වේගයට 2. වේගයෙන් 3. වේගය 4. වේගයේ

**13.** **තද කළු පැහැයෙන් මුද්‍රිත සංඛ්‍යාව නිවැරදි ව අකුරින් ලියා ඇති පිළිතුර තෝරන්න.**
**தடித்த எழுத்தில் உள்ள எண் எழுத்துக்களால் சரியாக எழுதப்பட்ட விடையை தெரிவு செய்க.**

35. පුස්තකාලයේ පොත් සංඛ්‍යාව **5568** කි.

1. පන්දහස් පන්සිය හැට අට
2. පන්සිය හැට අට
3. පන්දහස් හැට අට
4. පනස් පහයි පන්සිය හැට

**14. 36 සිට 40 තෙක් ප්‍රශ්නවල, ව්‍යාකරණානුකූලව නිවැරදි ව ලියා ඇති වාක්‍යය තෝරන්න.**
**36 முதல் 40 வரையுள்ள வினாக்களில் இலக்கணப்படி எழுதியுள்ள வாக்கியத்தை தெரிவு செய்க.**

36. 1. වෙළෙන්දා බඩු විකුණති.
2. වෙළෙන්දෝ බඩු විකුණති.
3. වෙළෙන්දෝ බඩු විකුණමු.
4. වෙළෙන්දිය බඩු විකුණති.

37. 1. මහ වැස්සට වැව් පිරී යයි.
2. මහ වැස්සට වැව් පිරී යති.
3. මහ වැස්සට වැව් පිරී යන්නෝ ය.
4. මහ වැස්සට වැව් පිරී යනු ලබයි.

38. 1. අම්මා කිරිබත් ඉව්වේ ය.
2. අම්මා කිරිබත් ඉව්වෝ ය.
3. අම්මා කිරිබත් ඉව්වා ය.
4. අම්මා කිරිබත් ඉව්වෙමු.

39. 1. අපි කොඩි කණුව සිටුවති.
2. අපි කොඩි කණුව සිටුවයි.
3. අපි කොඩි කණුව සිටුවමි.
4. අපි කොඩි කණුව සිටුවමු.

40. 1. සමනලයා මල් පැණි බොති.
2. සමනල්ලු මල් පැණි බොයි.
3. සමනල්ලු මල් පැණි බොති.
4. සමනල්ලු මල් පැණි බිව්වේ ය.

********

**II – පත්‍රය**

**I කොටසෙහි 01 සහ 02 ප්‍රශ්න ඇතුළු ව, II කොටසින් එක් ප්‍රශ්නයක් ද III කොටසින් ප්‍රශ්න දෙකක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

**I ம் பகுதியில் 01 மற்றும் 02 வினாக்கள் உட்பட, II ம் பகுதியில் ஒரு வினாவையும், III ம் பகுதியில் இரண்டு வினாக்களையும் தெரிவு செய்து மொத்தமாக ஐந்து வினாக்களுக்கு மாத்திரம் விடை எழுதுக.**

## I – කොටස / பகுதி – I / Part – I

**1. පහත දී ඇති මාතෘකාවලින් එක්ක තෝරාගෙන වචන 100 ක පමණ රචනාවක් ලියන්න.**
**கீழ் வரும் தலைப்புக்களில் ஒன்றை தெரிவு செய்து அதன் கீழ் ஏறததாழ 100 சொற்களில் அமையுமாறு ஒரு கட்டுரை எழுதுக.**

(අ). අපේ පාසලේ ක්‍රීඩා උත්සවය.

i. හැඳින්වීම
ii. ක්‍රීඩා උත්සවය සඳහා නිවාස සකස් කළ ආකාරය.
iii. ක්‍රීඩා උත්සවයේ පැවැත් වූ තරග.
iv. සහතික හා කුසලතා.
v. සමාලෝචනය.

(ආ). භාෂා කඳවුර.

i. හැඳින්වීම
ii. භාෂා කඳවුරක පවතින විවිධ අංග.
iii. භාෂා කිහිපයක් දැන ගැනීමේ වැදගත්කම.
iv. භාෂා කඳවුරකින් භාෂා කතා කිරීම දියුණු වන ආකාරය.
v. සමාලෝචනය.

(ඉ). පරිසරය රැක ගැනීම.

i. හැඳින්වීම
ii. පරිසරයට අයත් දේවල්.
iii. පරිසරය අපිරිසිදු වීම.
iv. පරිසරය පිරිසිදු ව තබා ගැනීම.
v. සමාලෝචනය.

(ඊ). අලුත් අවුරුදු උත්සවය.

i. හැඳින්වීම
ii. අවුරුදු උත්සවය සඳහා සූදානම් වීම.
iii. අවුරුදු දින සිදු කරන සිරිත් විරිත්.
iv. අවුරුදු ක්‍රීඩා
v. සමාලෝචනය.

(උ). මාර්ග අනතුරු වළක්වා ගනිමු.

i. හැඳින්වීම
ii. මාර්ග අනතුරු නිසා ඇතිවන ප්‍රතිඵල.
iii. මාර්ග අනතුරු ඇතිවීමට හේතු.
iv. මාර්ග අනතුරු වළක්වා ගැනීමට කළ යුතු දේවල්.
v. සමාලෝචනය.

(ලකුණු - 20)

**2. පහත පින්තූරය බලා ඒ ඇසුරින් අර්ථවත් වාක්‍ය 05ක් ලියන්න.**
**படத்தை பயன்படுத்தி கருத்துள்ள 05 வாக்கியங்களை எழுதுக.**



(ලකුණු - 10)

**II – කොටස / பகுதி – II / Part – II**

- **අංක 03 සහ 04 යන ප්‍රශ්නවලින් එකකට පමණක් පිළිතුරු සපයන්න.**
  **03 மற்றும் 04 வினாக்களுள் ஏதேனும் ஒரு வினாவுக்கு மாத்திரம் விடை எழுதுக.**

**3. පහත සඳහන් කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
**பின்வரும் கவிதையை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.**

මේ රට මගෙ රට - මා ඉපදුණු රට
හැදෙන වැඩෙන රට - මගේ ම මව් රට

සරු පස පොළොවෙන් - වැහි බිඳු අහසින්
මිණි කැට මුතු කැට - ඇත මගේ සිරි ලක

මගෙ සිරිලක ගැන - ලොවට කියමි මම
සුර පුරයන් වෙන - ලොවෙහි මෙවැනි නැත

01. මෙම කවි පන්තියෙන් කියැවෙන්නේ කුමක් ගැන ද?
02. සුරපුරයක් යනු කුමක් ද.
03. මෙහි සඳහන් වන, ලංකාවේ පොළොවෙන් ලැබෙන වටිනා දේවල් මොනවා ද?
04. ''ලොවේ මෙවැනි නැත'' යනුවෙන් සටහන් වන්නේ ඇයි ?
05. **'ලෝකය'** යන වචනයට සමානාර්ථවත් වචනයක් කවියෙන් උපුටා ලියන්න.

(ලකුණු - 10)

**4. පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
**பின்வரும் பந்தியை வாசித்து, கேட்கப்பட்டுள்ள வினாக்களுக்கு விடை எழுதுக.**

ගස් බෙනයක මීයක් ඇති බව ගැමියා දැන ගන්නේ මී මැස්සන්ගේ ගුමු ගුමු නාදයෙනි. මී මැස්සන්ගේ ගුමු ගුමු නාදය ගැමියා හඳුන්වන්නේ ''මීය ගුගුරනවා'' යනුවෙනි. මී වද දෙවර්ගයකි. ඒවා ''පැණි වද'' සහ ''පිලව් වද'' යනුවෙන් ගැමියෝ හඳුන්වති. ''කිරි වද'' යනු පිලව්වලට යෙදෙන වෙනත් නාමයකි. සුදු වර්ණයෙන් යුත් ළපටි පැටවුන් පිලව් යනුවෙන් හැඳින් වේ.

මී පැණි පිරුණු වද, පැණි වද නම් වේ. පැණි වදය ''ඉහල්'' යනුවෙන් ද ගැමියෝ හඳුන්වති. ''ඉහල් ඔරු'' යනු පැණි පිරුණු සිදුරු ය'. මී මැස්සේ සිදුරු පැණියෙන් පුරුවා එහි මුහුණත් වසා දමති. ගැමියන් මෙය හඳුන්වන්නේ ''මීය පිය ගෑම'' යනුවෙනි.

01. ''මීය ගුගුරනවා'' යනුවෙන් අදහස් කරන්නේ කමක් ද?
02. මී වද දෙවර්ගයකි. ඒවා මොනවා ද?
03. මීයන් ඇති බව ගැමියා දැන් ගන්නේ කෙසේ ද?
04. සුදු වර්ණයෙන් යුතු ළපටි පැටවුන් සිටින වදය කුමන නමකින් හඳුන්වයි ද?
05. මෙම ඡේදයේ සඳහන් ගැමියාගේ ජීවන වෘත්තිය කුමක් විය හැකි ද?

(ලකුණු - 10)

## III – කොටස / பகுதி – III / Part – III

- **අංක 05 සහ 06 යන ප්‍රශ්න දෙකටම පිළිතුරු සපයන්න.**
  **05 மற்றும் 06 ஆகிய இரண்டு வினாக்களுக்கும் விடை எழுதுக.**

**5. පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන අයදුම් පත්‍රයක් සකස් කරන්න.**
**பின்வரும் விடயங்களை கருத்திக்கொண்டு விண்ணப்பம் ஒன்றை தயாரிக்குக.**

ෆාම්ස් ලංකා ලංකා පුද්ගලික ආයතනය පරිගණක දත්ත සහායකයින් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සහිත අයගෙන් අයදුම් පත් කැඳවා ඇත.

- ශ්‍රී ලංකා පුරවැසියකු වීම.
- වයස අවු. 18 - 35 අතර වීම.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සමත් වීම.
- පරිගණක පාඨමාලාවක් හදාරා තිබීම.
- සේවා පළපුරුද්ද අමතර සුදුකමක් සේ සැළකේ.

ඔබ, කුෂානි නවරත්න යැයි සිතා, ඉහත සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇති බැවින් අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම් පත්‍රයක් සකස් කරන්න.

**නැතහොත් / அல்லது**

පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන රාජකාරි ලිපියක් ලියන්න.
**பின்வரும் விடயங்களை கருத்திக்கொண்டு பொருத்தமான உத்யோகபூர்வ கடிதம் ஒன்றை எழுதுக.**

ඔබ පාසලේ වාර්ෂික කලා උළෙල මෙවරත් උත්කර්ෂවත් අන්දමින් පැවැත්වීමට විදුහලේ කලා සංගමය තීරණය කර ඇත. පාසලේ විදුහල්පති කාංචන කරුණානායක ඔබ යැයි සිතා, මෙම උත්සවයේ ප්‍රධාන අමුත්තා ලෙස සහභාගී වන මෙන් ඉල්ලා සිටිමින්, කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙත විදුහල්පතිවරයා යවන ලිපිය ලියන්න.

(ලකුණු - 10)

**6. පහත දැක්වෙන දෙමළ වාක්‍ය සිංහලට පරිවර්තනය කරන්න.**
**கீழே தரப்பட்டுள்ள கருத்திக்கொண்டு அறிவித்தல் ஒன்றை தயாரிக்குக.**

1. திங்கட்கிழமை பரிசளிப்பு விழா நடைபெறும்.
2. ஆசிரியை சிரித்துக் கொண்டு வகுப்புக்கு வந்தாள்.
3. மாலைப்பொழுதில் வானம் அழகான காட்சி தருகிறது
4. திருகோணமலையில் இயற்கைத் துறைமுகம் அமைந்துள்ளது.
5. நுவரெலியா அழகான மலைப் பிரதேசமாகும்.

**නැතහොත් / அல்லது**

**පහත දැක්වෙන තොරතුරු පදනම් කරගෙන සංවාදයක් ලියන්න. (වාක්‍ය 10ක් ප්‍රමාණවත් වේ)**
**பின்வரும் தகவகல்ளை அடிப்படையாகக் கொண்டு உரையாடல் ஒன்றை எழுதுக.**
**(10 வாக்கியங்கள் போதுமானவை)**

විදුහල්පතිතුමා ඔබව කාර්යාලයට කැඳවා ඇත. ඔබ කාර්යාලයට ගිය පසු විදුහල්පතිතුමා ඔබගෙන් පවුලේ තොරතුරු විමසයි. ඔබ සහ විදුහල්පතිතුමා අතර ඇතිවන සංවාදය ලියන්න.

(ලකුණු - 10)